**<u>වර්ෂ 2022 ක් වූ අගෝස්තු මස 25 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව</u>**

<u>පැමිණීම</u>

01. ගරු සභාපති - ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
02. ගරු උප සභාපති - එච්.ඒ නන්දසෝම මහතා
03. ගරු මන්ත්‍රී - ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
04. ගරු මන්ත්‍රී - ශාන්තලාල් පෙරේරා මහතා
05. ගරු මන්ත්‍රී - ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
06. ගරු මන්ත්‍රී - එච්.ජී මෛත්‍රීපාල මහතා
07. ගරු මන්ත්‍රී - අයි.රාමකිලි මහතා
08. ගරු මන්ත්‍රී - ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
09. ගරු මන්ත්‍රී - කේ.ඕ කුසුම්ලතා මිය
10. ගරු මන්ත්‍රී - එන්.එම් සුසිලා දමයන්ති මිය
11. ගරු මන්ත්‍රී - එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
12. ගරු මන්ත්‍රී - පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
13. ගරු මන්ත්‍රී - එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
14. ගරු මන්ත්‍රී - එස්.එල්.අරුණ ශාන්ත මහතා
15. ගරු මන්ත්‍රී - කේ.ඕ සෝමතිලක මහතා
16. ගරු මන්ත්‍රී - එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
17. ගරු මන්ත්‍රී - ජී.කේ.පී ෆොන්සේකා මිය

<u>නොපැමිණීම</u>

01. ගරු මන්ත්‍රී - වී.මුරලිදරන් මහතා
02. ගරු මන්ත්‍රී - එච්.ජී මහින්ද ගුණසේකර මහතා
03. ගරු මන්ත්‍රී - එච්.ඒ.එන්.සී රණසිංහ මහතා

**<u>01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරිම</u>**

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>

2022 ජූලි මස මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 ජූලි මස මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>**

<u>02 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

සභාව සතු 252 – 6380 දරණ කැබ් රථය සඳහා Wiper Arm With Blades මිලදී ගැනීම පිළිබඳවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 02 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක් වූ පාලම් නැවත සකස් කිරිම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 03 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>

පළාත් පාලන ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වලට අදාල වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන වල ණය හිමි ශේෂ දැක්වීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
රා.ප.ච 14/2022 අනුව ජොෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම.

02 - 05 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස්,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
2022.06.23 දිනැති මහා සභා වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
සභාවට අයත් 252 – 6380 අංක දරණ කැබ් රථය අලුත්වැඩියා කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මැතිතුමා වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් රු:40,000.00 මුදලක් ග්ලෙන්ෆන් වතු නිවාස සඳහා පීවීසී බට ලබා දීම වෙනුවෙන් සභා අරමුදලින් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක් වූ පාලම් නැවත සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සභා අරමුදල් සංවර්ධන යෝජනා ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්,පැමිණිලි හා ලිපි සභාගත කිරීම**
නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
මා විසින් ඉදිරිපත් කරන ලද බලංතොට සමුපකාරය අසල ප්‍රජා ශාලාවේ දැල් ආවරණය කර සංවර්ධනය කිරීම යන යෝජනාව සඳහා රු:200,000.00 මුදලක් වෙන් කළ අතර එම මුදල රු:250,000.00 වශයෙන් සංශෝධනය කර එම කර්මාන්තය සිංහ ප්‍රජා මණ්ඩලය වෙත ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා පෙ.ව 10.40 සභා ගර්භයෙන් පිටව යන ලදී.

05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගෙන සංචාරක සුවපහසු සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

252 - 6380 අංක දරණ කැබ් රථයේ නව එන්ජිමක් සවි කර දැනට කිලෝමීටර ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ධාවනය කර ඇති බැවින් එම එන්ජිමේ ටී බෙල්ට් හා එජස්ටර් මාරු කිරීමට ඇති බැවින් අදාල නඩත්තු කටයුතු සිදු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව මේ සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 04 ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය

මා හට 2022 වර්ෂය සඳහා සභා අරමුදලින් ලැබෙන ලක්ෂ තුනක මුදලින් රු:30,000.00 මුදලක් නාවලපිටිය වරකාව වසමේ පත්තුනුපිටිය අවමංගලාධාර සමිතියට අවශ්‍ය පුටු ලබා දිමත් එම භාණ්ඩ පත්තුනුපිටිය එක්සත් අවමංගලාධාර සමිතිය වෙත ලබා දීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 05 ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය

මා හට 2022 වර්ෂය සඳහා සභා අරමුදලින් ලැබෙන ලක්ෂ තුනක මුදලින් නාවලපිටියේ පත්තුනුපිටිය විද්‍යාලයේ පුස්තකාලයට අවශ්‍ය පොත් ලබා ගැනීම සඳහා රු:20,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 06 ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය

මා හට 2022 වර්ෂය සඳහා සභා අරමුදලින් ලැබෙන ලක්ෂ තුනක මුදලින් නාවලපිටිය පල්ලේගම ප්‍රජා ශාලාවට අවශ්‍ය දිග අඩි 08 හා පළල අඩි 8 කින් යුත් දැවමය මේසයක් ලබා දීම සඳහා රු:30,000.00 මුදලක් ලබා දීම සුදුසු බවත් එම භාණ්ඩ ශක්ති කාන්තා සමිතිය වෙත ලබා දීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී අරුණ ශාන්ත මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 07 ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය

ඉහත නම සදහන් මා හට 2022 වර්ෂය සදහා සභා අරමුදලින් ලැබෙන ලක්ෂ 03ක මුදලින් නාවලපිටිය පල්ලේගම ශ්‍රී නන්දනාරාම පුරාණ විහාරස්ථානයේ විහාර මන්දිරයේ සංවර්ධන වැඩ සදහා රු:70,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සදහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 08 ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය</u>
ඉහත නම සදහන් මා හට 2022 වර්ෂය සදහා සභා අරමුදලින් ලැබෙන ලක්ෂ තුනක මුදලින් නාවලපිටිය ශ්‍රී සුන්දරාරාම පුරාණ විහාරස්ථානයේ කැටගල් අල්ලා සංවර්ධනය කිරිම සදහා රුපියල් පනස් දහසක මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සදහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 09 ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය</u>
ඉහත නම සදහන් මා හට 2022 වර්ෂය සදහා ලැබෙන සභා අරමුදලින් ලැබෙන ලක්ෂ තුනක මුදලින් නාවලපිටිය කහමාන රංසිමාලාකාරාම විහාරස්ථානයේ පුස්තකාලයට අවශ්‍ය පොත් රාක්ක හා මේසයක් ලබා ගැනීමට රුපියල් ලක්ෂයක මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සදහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අප සභාව මගින් පාලනය වන ගලබඩ ඇල්ල සංචාරක මධ්‍යස්ථානය වෙත නන් දෙසින් ජනතාව පැමිණෙන අතර පැවති වසංගත තත්ත්වය පහව යාමත් සමග විශාල වශයෙන් ජනතාව පැමිණෙමින් සිටී.එම පිරිස සිරි නැරඹීමට අමතරව ස්නානය සදහාද නැඹුරුතාවයක් දක්වයි.එම පිරිසෙන් අතලොස්සක් දෙනා ඉතා අවධානම් ක්‍රියාවන් සදහා යොමු වන අතර පසුගිය දිනක තරුණියක් අනතුරකටද ලක් වුණා.ඒ අනුව අප සභාව ප්‍රවේශ පත්‍ර අලෙවි කොට අවශ්‍ය අවම පහසුකම් හා විවිධ අපහසුතා මධ්‍යයේ ඉහත සේවාව පවත්වා ගෙන යන අතර යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කොට විධිමත් කරන තුරු ප්‍රවේශය අභියස ත්‍රිභාෂාවෙන් අවවාදාත්මක දැන්වීම් පුවරුවක් සවි කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී අරුණ ශාන්ත මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
සභාවේ සවි කොට ඇති ගිනි නිවන උපකරණ 2022.09.27 දිනෙන් කල් ඉකුත් වන බැවින් එම උපකරණ යාවත්කාලීන කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අප සභාව මගින් ප්‍රදේශය පුරා වීථි පහන් 350 පමණ සවි කොට ඇති අතර මෑතකදී අලුත්වැඩියා කල කඩියන්ලෙන නගරය හැර මේ වන විට ඉන් බොහොමයක් අක්‍රීය වී ඇත. මේ වන විට අප සතුව පහන් කට්ටල 135 පමණ ඇති අතර අත්‍යවශ්‍යම ස්ථාන සඳහා ප්‍රමුඛත්වය ලබා දී අලුත්වැඩියා කිරිම සුදුසු වන බැවින් එම ස්ථාන නම් කිරිම සුදුසු හා එම පහන් සඳහා විදුලිය කාන්දු කර ගන්නා උපකරණය ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පසුගිය කාල වකවානුව තුළ පැවති වසංගත රෝගී තත්ත්වය හා ආර්ථික අපහසුතාවය හේතුවෙන් අප කාර්යාල සේවා යම් පමණකට අඩපණ වූ අතර සිදු කළ යුතු අත්‍යවශ්‍ය සේවා පවා නියමිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.මේ හේතුවෙන් මාර්ග,කාණු පද්ධති,විදුලිය වැනි දෛනිකව නඩත්තු කළ යුතු කාර්යයන් මෙන්ම ආදායම් රැස් කිරිම ආදී කටයුතු සීමා සහිත වී ඇත.මේ වන විට පැවති තත්ත්වය යම් දුරකට සමනය වී ඇති බැවින් අප සභාවේ සේවාවන් ඒ ඒ කොට්ඨාස වලදී "පළාත් පාලනය ගමට "තේමාව යටතේ ජංගම සේවා වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරිම ඉතාමත් යෝග්‍ය වන අතර ඒ සඳහා 2022 අයවැය ලේඛනය මගින් අංක 605 9 ඃ ජංගම සේවා පැවැත්වීම හා අංක 605 9 ඃI ශ්‍රමදාන කටයුතු පැවැත්වීම යටතේ වෙන් කර ඇති මුදල් ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පසුගිය කාලයේ පැවතුන තත්ත්වයත් එක්ක අපිට හැකියාවක් ලැබුනේ නෑ ගමට ගිහින් සේවයක් කරන්න.නමුත් දැන් ඒ තත්ත්වය පහව ගිහින් තියෙනවා.පසුගිය කාලයේ අපි ගමත් එක්ක පැවතුන සම්බන්ධතාවය දුරස් උනා.මේ වැඩසටහනේදී අපි බලාපොරොත්තු වෙනවා මාර්ග ටික නඩත්තු කිරිමේ වැඩපිළිවෙලක් සකස් කරන්න.ඒ වගෙම වීථි පහන් නඩත්තු කටයුතු කරන්නත් ඕනි.සතියකට එක දවසක් බැගින් තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ.ගමේ අයත් සම්බන්ධ කරගන්න ඕනි මේ වැඩේට.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
සභාවට අයත් මාර්ග විතරයිද සභාපතිතුමා මේ වැඩසටහනට අයත් වෙන්නේ.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අපි මේ වැඩසටහනට පළාත් මාර්ග සංවර්ධන එකත් සම්බන්ධ කරගමු.එතකොට ඒ පාරවල් ටිකත් සකස් කරන්න පුලුවන්.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පැරණි ප්‍රාදේශීය සභා කාර්යාල භූමියේ අනතුරුදායක ලෙස ඇති කැන්ද ගසක්,අලි මඤ්ඤොක්කා ගසක්,පොල් ගසක්,කොට්ටම්බා ගසක් යන ගස් කපා ඉවත් කිරිමේ ගාස්තු වෙනුවට හෙලන ගස් හිලව් කර ගැනීමට කැපුම්කරු එකඟ බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පවතින අයහපත් කාලගුණය හා ක්ෂේත්‍ර කටයුතු වලදී පවතින දුෂ්කරතාවන් හේතුවෙන් සුළු සේවකයින්ගේ ආරක්ෂාව සඳහා පහත උපකරණ ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

- ගම් බූට්ස් යුගල 20
- ආලෝකය විහිදුවන උඩුකය කබා 20
- මාර්ග සංඥා කෝන් 04
- වැහි කබා 20

ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 16 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කසල ප්‍රවාහන කටයුතු සඳහා අප සභාව මගින් සේවය ලබා ගන්නා ආයතන හා සේවා ස්ථාන සඳහා ප්‍රවාහන ගාස්තු අය කෙරේ.ඒ අනුව රඹුක්පිටිය දෙවන සැතපුම් කණුව ලිපිනයේ පිහිටි හයිලන්ඩ් ෆ්ලයිස්(පුද්)සමාගම තුළින් අය කරනු ලබන්නේ එක් ගමන් වාරයකට රු:500.00 මුදලකි.පවතින ඉන්ධන වියදම් හා අනෙකුත් වියදම් සැලකීමේදී එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් එම සේවා ගාස්තුවද රු:2000.00 දක්වා වැඩි කර ගාස්තු ගෙවීමෙන් පසු සේවය සැපයීමත් සුදුසු වන බව මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
WPPF 7405 අංක දරණ සභාවට අයත් කැබ් රථයේ ටින්කරින් හා පේන්ටින් යන අලුත්වැඩියාවන් සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 18 ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු:ලක්ෂයක මුදලක් වටගොඩහින්න හරහා වෙරලුගොල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරිම සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 19 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

රඹුක්පිටිය මහජන පුස්තකාලය සඳහා 2022 වර්ෂයට අයවැයෙන් 609 - 4 යටතේ වෙන් කර ඇති මුදලින් පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 20 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ජාතික කියවීමේ මාසය නිමිත්තෙන් පුස්තකාල පාඨකයින්ට නොමිලේ සාමාජිකත්වය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 21 ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
2022 වර්ෂය සඳහා මා හට ලැබෙන සභා අරමුදල් ලෙස ලබා දෙනු ලබන රුපියල් ලක්ෂ තුනක මුදලින් දෙකිද සුසාන භූමිය බැකෝ යන්ත්‍රයක් දමා මට්ටම් කිරිම සඳහා රුපියල් ලක්ෂයක මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 22 ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
2022 වර්ෂය සඳහා මා හට ලබා දෙනු ලබන සභා අරමුදල් ලක්ෂ තුනෙන් රුපියල් ලක්ෂයක මුදලක් වැවේගම සුසාන භූමිය බැකෝ යන්ත්‍රයක් යොදා මට්ටම් කිරිමට හා සුසාන භූමියට ජලය ලබා ගැනීමට අවශ්‍ය අහල් 2 බට ලබා ගැනීමට ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 23 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
සභාව සතු ජේසීබී යන්ත්‍රයේ පවතින පහත සඳහන් අලුත්වැඩියාවන් සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- හයිඩ්‍රොලික් ජැක් සීල් දැමීම.
- පින් බුෂ් ගැසීම.
- ඉන්ජෙක්ටර් පොම්පය සර්විස් කිරිම.
- අලුතින් ග්‍රීස් නිපල් දැමීම.
- ඉදිරිපස රෝද දෙකේ ඔයිල් සීල් දැමීම.
- හයිඩ්‍රොලික් හෝස් අලුතින් දැමීම.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාව පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 24 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක් වූ පාලම් නැවත සකස් කිරිම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම යන මැයෙන් වූ ලිපිය අනුව එම තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා සභාවෙන් දෙදෙනෙක් පත් කරන්න ඕනි.ඒ සඳහා තාක්ෂණ නිලධාරි එස්.කේ.ගුණරත්න මයා හා පරිසර නිලධාරි දිල්රුක් දිසානායක මයා සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
නව ගම්මානය පහු කරාම පාලමක් තියෙනවා.ඒකත් අබලන්.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පළමුවෙන් මේ පාලම් හදලා නිම කරලා අනෙක් පාලම් ටිකත් සකස් කරගන්න කටයුතු කරමු.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 25 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මාපාකන්ද ප්‍රධාන පාරේ බේකරි හන්දියේ සිට මීටර් 250 පමණ දුරින් ඒබීසී යෙදීම සඳහා රුපියල් ලක්ෂයක මුදලක් වෙන් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
බල ප්‍රදේශයේ ගංවතුරට නිරන්තරයෙන් ලක් වන පවුල් 250 පමණ අඳුනගෙන තියෙනවා.ඒ වගේම නාය යෑම් අවධානම් වලට ලක් වෙලා ඉවත් කරන්න කියලා තියෙන පවුල් සංඛ්‍යාවක් තියෙනවා.අපි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න හදලා තියෙනවා ඉඩමක් අඳුනගෙන.ඒ ඉඩමට යන්න එකග කරගෙන එයාලාව ඒ ස්ථාන වලට යවන්න කටයුතු කරනවා.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
ලබුවැල්කොටුව හා කිතුල්කොටේ යන ප්‍රදේශත් එහෙමයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
දැනට අපි හඳුනගෙන තියෙනවා බෝහිල් එකයි හැරන්ඩල් එකයි හයින්ෆෝඩ් එකයි.ඉඹුල්පිටියේ අක්කර 10ක් තියෙනවා.එක නිවසක් හදන්න ලක්ෂ 40 මුදලක් තියෙනවා.පොදු සැලැස්මක් ඇදලා දෙනවා මේකෙදි.මුදල් තියෙන අයට ඊට වඩා ලොකු සැලැස්මක් අනුව ගෙදර හදන්නත් පුලුවන්.වැලිගම්පළ වැල් පාලමත් අවධානම් තත්ත්වයේ තියෙන්නේ.වතුර පාර ඇවිල්ලා කෙලින්ම වදින්නේ පාලමේ කණුවේ.කඩාගෙන යන්න උනත් පුලුවන්.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 26 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගංවතුරට යන වන හා අවධානම් ප්‍රදේශ වල නිවාස සැලසුම් ඉදිරිපත් වෙනවා.එහෙම අවධානම් සහිත නිවාස සැලසුම් වලට අනුමැතිය ලබා දෙන්නත් හැකියාවක් නෑ.අපි ලබන සභාවට ඒ ප්‍රදේශ සඳහන් සිතියමක් ඉදිරිපත් කරමු.ඒ වගෙම ගංවතුරට යට වන හා අවධානම් ප්‍රදේශ වල ඉදිරිපත් කරනු ලබන නිවාස සැලසුම් සඳහා පරිසර නිලධාරි මහතාගෙන් වාර්තාවක් ලබා ගැනීමෙන් පසු අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාව පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 27 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

සභාවට අයත් LL 7484 දරණ කැබ් රථයේ ඉටු කළ යුතු අලුත්වැඩියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉංජිනේරු මහතා විසින් පහත පරිදි නිර්දේශ ලබා දී ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

- ගැස්කට් ඕරෝල්
- පිස්ටන් 04
- පිස්ටන් රින්ස්
- මේන් බෙයාරින් සෙට්
- බිගන් බෙයාරින් සෙට්
- හෙඩ් ජෙස්
- පිස්ටන් ස්ලිව්
- සිලිව් බෝරින්
- එන්ජින් ඔයිල්
- ඔයිල් ෆිල්ටර් යෙදීම
- රේඩියේටරය සර්විස් කිරීම/අලුත්වැඩියාව

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාව පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත වාහනයේ නිර්දේශ කරනු ලැබූ අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 28 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

නාගරික සංවර්ධන අධිකාරිය සමග පැවති සාකච්ජාවේදී ප්‍රදේශ කිහිපයක් නාගරික ප්‍රදේශ බවට පත් කිරීමට යෝජනා උනා.එහිදි අලුත්ගම ප්‍රදේශය මේ සඳහා යෝජනා උනත් මේ ප්‍රදේශයේ ඒ සඳහා පසුබිමක් නෑ.ඒ නිසා අලුත්ගම ඉවත් කරමු.මේ සඳහා කරහඳුන්ගල ,කැන්දෝපිටිය, වැලිගම්පළ, වැලිගොඩවත්ත, පල්ලේගම, වරකාව, හෛඩ්‍රි, කඩියන්ලෙන, බලංතොට උතුර,පහළ රඹුක්පිටිය,උඩ රඹුක්පිටිය,පැණිතුඩුව,මාපාකන්ද උතුර,වැවේගම යන ප්‍රදේශ නම් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාව පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා හා අයි.රාමකිලි මහතා පෙ.ව 11.50 සභා ගර්භයෙන් පිටව යන ලදී.

05 - 29 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් කාර්යයන් ඉතා ඉක්මනින් ඉටු කළ යුතු බවට මම යෝජනා කරමි.

- ඉඟුරුඔය වැල් පාලම ප්‍රතිසංස්කරණය කිරීම.
- ගලබඩ දිය ඇල්ලේ කවුළුව ප්‍රතිසංස්කරණය කිරීම.
- පැණිතුඩුව හා මීපිටිය වැල් ඉවත් කිරීම
- වැවේගම වැල් එක සකස් කිරීම.

ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය

එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාවන් පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාවන් ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 30 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022.09.03. වන දිනට යෙදෙන පොලිස් දිනය නිමිත්තෙන් නාවලපිටිය පොලිස් ස්ථානය මගින් සංවිධානය කරනු ලබන සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය සඳහා මෙම ආයතනයෙන්ද කණ්ඩායමක්ද ඉදිරිපත් වන අතර එම තරගාවලිය සඳහා සභාව මගින් සංග්‍රහ කටයුතු සඳහා දායකත්වයක් ලබා දීමට 2022 අයවැය මගින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා 607 – 1 i යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති මුදලින් රු:15000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාව පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව උක්ත තරගාවලිය සඳහා 2022 අයවැය මගින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා 607 – 1 i යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති මුදලින් රු:15000.00 මුදලක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 31 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022 වර්ෂයේ සභාව වෙත නවක සංවර්ධන නිලධාරී පත්වීම් 10ක් ලැබී ඇති හෙයින් 2022 වර්ෂය සඳහා වාර්ෂික වැටුප් වියදම ලෙස ඇස්තමේන්තු කළ අගය ප්‍රමාණවත් නොවී ඇත.එම නිසා එම නිලධාරින්ගේ වැටුප් ගෙවීම සඳහා පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

| අනු අංකය | විස්තරය | අය/වැය ශීර්ෂය | හර | බැර |
|---|---|---|---|---|
| 01 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ලබා ගැනීමට අපේක්ෂිත ආදායම් ආධාර | 1-71 | | 600,000.00 |
| 02 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ලබා ගැනීමට අපේක්ෂිත ආදායම් ආධාර | 2-71 | | 500,000.00 |
| 03 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ලබා ගැනීමට අපේක්ෂිත ආදායම් ආධාර | 3-71 | | 2,150,000.00 |
| 04 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ලබා ගැනීමට අපේක්ෂිත ආදායම් ආධාර | 4-71 | | 300,000.00 |
| 05 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ලබා ගැනීමට අපේක්ෂිත ආදායම් ආධාර | 6-71 | | 100,000.00 |
| 06 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ගෙවීමට අපේක්ෂිත වැටුප් හා දීමනා | 101-1 හා 101-6 | 600,000.00 | |
| 07 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ගෙවීමට අපේක්ෂිත වැටුප් හා දීමනා | 201-1 හා 201-6 | 500,000.00 | |
| 08 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ගෙවීමට අපේක්ෂිත වැටුප් හා දීමනා | 301-1 හා 301-6 | 2,150,000.00 | |
| 09 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ගෙවීමට අපේක්ෂිත වැටුප් හා දීමනා | 401-1 හා 401-6 | 300,000.00 | |

| | | | | |
|---|---|---|---|---|
| 10 | 2022 වර්ෂයේ නවක පත්වීම් නිසා ගෙවීමට අපේක්ෂිත වැටුප් හා දීමනා | 601-1 හා 601-6 | 100,000.00 | |
| | | | **3,650,000.00** | **3,650,000.00** |

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාව පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 32 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>
රොසැල්ල හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයට අවශ්‍ය කරන වීදුරු,පිඟන් හා පීරිසි කෝප්ප ලබා දීම සඳහා 2022 වර්ෂයේ මා වෙත වෙන් කරන ලද සභා අරමුදල් වලින් රු:30,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට පසුගිය සභා වාරයකදී යෝජනා ස්ථිර කර සභා සම්මත කර ගන්නා ලද අතර එම යෝජනාවේ භාණ්ඩ ලබා දෙනු ලබන්නේ විහාරස්ථාන කාර්ය සාධක සමිතිය වෙත යන්න සඳහන් කිරීමට නොහැකි වූ බැවින් එම කරුණද ඇතුලත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරීම.**</u>

06 - 01 මුදල් කාරක සභාව - 2022.08.15
06 - 02 නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව - 2022.08.10
06 - 03 කාර්මික සේවා කාරක සභාව - 2022.08.10
06 - 04 පරිසර හා පොදු පහසුකම් කාරක සභාව - 2022.08.10
06 - 05 ගැටුම් සමථකරණ කාරක සභාව - 2022.08.19

<u>07. **බැංකු සැසඳුම් ප්‍රකාශය,අභ්‍යන්තර විගණන වාර්තාව,ලැබීම් සාරාංශය,ගෙවීම් සාරාංශය,ගෙවීම් වාර්තාව,පුස්තකාල ප්‍රගතිය,ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම**</u>

- 2022.07.01 දින සිට 2022.07.30 දක්වා වවුචර් අංක 719 සිට 810 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසඳුම් ප්‍රකාශය

ගිණුම් අංකය - 053100164889286
මාසය - 2022 ජූලි

| | | |
|---|---|---|
| 2022.07.01 දිනට මුදල් පොතේ ශේෂය | රු: 2,296,273.19 | |
| එකතු කළා ජූලි මස මුළු ලැබීම් | රු: 4,266,617.38 | |
| අඩු කළා ජූලි මස මුළු ගෙවීම් | රු: 4,238,971.01 | |
| 2022.07.30 දිනට මුදල් පොතේ ශේෂය | | රු: 2,323,919.56 |
| <u>එකතු කළා</u> | | |
| නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | රු: 425,738.02 | |
| සෘජු ප්‍රේෂණ | රු: 37,449.00 | |
| | | රු: 463,187.02 |
| | | 2,787,106.58 |
| <u>අඩු කළා</u> | | |
| බැංකු ගාස්තු | රු 112.00 | |
| අත ඉතිරි මුදල් | රු: 47,387.00 | |

2022.08.25 දින මහා සභාව
රු: 47,999.00

2022.07.30 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය රු:2,739,607.58

- 2022 ජූලි මස ගෙවීම් සාරාංශය

| විස්තරය | මුදල (රු) |
|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,146,542.32 |
| 02. ගමන් වියදම් | 54,877.00 |
| 03. සැලසුම් හා උපකරණ | 348,012.85 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 202,870.00 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 91,454.45 |
| 06. පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 21,389.04 |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 159,195.91 |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | - |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **4,024,341.57** |
| 09. ප්‍රාග්ධන වැය | - |
| 10. ණය ආපසු ගෙවීම් | 233,792.82 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **233,792.82** |
| **පුන:වැය හා ප්‍රාග්:වැය මුළු එකතුව** | **4,258,134.39** |
| විවිධ ණය හිමියන් | 77,900.00 |
| කර්:ණය හිමියන් (309-3-1) | - |
| කර්:ණය හිමියන් (309-3-111) | - |
| කර්:ණය හිමියන් (304-5) | - |
| 10% කර්මාන්ත තැම්පත් | - |
| විවිධ තැම්පත් | 74,435.01 |
| මුද්දර තැම්පත් | - |
| දේපල ණය | 12,534.05 |
| සේවක ණය | - |
| අත්තිකාරම් | 183,150.00 |
| සමුච්චිත අරමුදල | - |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 145,604.40 |
| ජල ගබඩා අත්තිකාරම් | - |
| අගරු චෙක්පත් | - |
| කර්:ණය ගැතියන් | - |
| **එකතුව** | 493,623.46 |
| **2022.07.30 දක්වා මුළු ගෙවීම් එකතුව** | **4,751,757.85** |

- 2022 ජූලි මස ලැබීම් සාරාංශය

| • අය විෂයය නාමයන් | මුදල (රු) |
|---|---|
| 10 වරිපනම් හා බදු | 380,489.52 |
| 20 කුලී | 36,258.80 |
| 30 බලපත්‍ර ගාස්තු | 17,774.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 138,371.00 |

| | |
|---|---|
| 50 වරෙන්තු ගාස්තු | 12,126.70 |
| 60 වෙනත් ආදායම් | 465,869.30 |
| 70 වෙනත් ආධාර | 3,020,359.19 |
| මූලධන ලැබීම් | 76,919.47 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | **4,148,167.98** |
| ජල ණය ගැතියෝ | |
| ජල තැම්පත් | 500.00 |
| මුද්දර | 1,600.00 |
| විවිධ තැම්පත් | 139,236.33 |
| සේවක ණය | 194,023.00 |
| කර්මාන්ත තැම්පත් | - |
| දේපල ණය | 12,534.06 |
| විවිධ ණය ගැතියෝ | - |
| අත්තිකාරම් පියවීම | 203,090.00 |
| අත්තිකාරම් පියවීම ජල ගබඩා | 78,802.85 |
| රු 25 මුද්දර | 1,450.00 |
| සැලසුම් හා උපකරණ | - |
| කර්මාන්ත ණය ගැතියෝ | - |
| වෙනත් ලැබීම් වල එකතුව | 631,236.24 |
| 2022.07.30 දක්වා මුළු ලැබීම් | **4,779,404.22** |

- 2022 ජූලි මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 12

02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 15

03. පොත් බැහැර දීම - 1284

04. ව්‍යාප්ත සේවා -

05. රැස්කළ ආදායම(පුස්තකාල)- 2300.00

(නැණසල) - 7000.00

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 - 01 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා ආදායම් පරික්ෂක ලදුපොත් 100 , රතු නිවේදන පොත් 05 හා ලිපි ශීර්ෂ 2500 (පොත් 05) මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | Sayara Graphic & Printing Solution,Nawalapitiya | රාජා මුද්‍රණාලය,නාවලපිටිය | මිඩ්ලන්ඩ් ප්‍රින්ටර්ස්,නාවලපිටිය | නව ළහිරු මුද්‍රණාලය,ගම්පොල | A.M.P print shop,ගම්පොල | Leo printers,Gampola |
|---|---|---|---|---|---|---|
| ආදායම් පරික්ෂක ලදුපොත් | 65000.00 | 60000.00 | 64000.00 | 59500.00 | 59200.00 | 58500.00 |
| රතු නිවේදන පොත් | 6000.00 | 5000.00 | 6500.00 | 2900.00 | 3000.00 | 2800.00 |
| ලිපිශීර්ෂ පොත් | 43000.00 | 39000.00 | 42000.00 | 47500.00 | 48750.00 | 23250.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “Leo printers,Gampola” යන ආයතනයෙන් අදාල මුද්‍රණ කටයුතු සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 02 කාර්යාල හැඳුනුම්පත් සකස් කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| Radium Creations,Nawalapitiya | Studio Sandali,Nawalapitiya | Lakru,Rabukpitia |
|---|---|---|
| 900.00 | 850.00 | 800.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "Lakru,Rabukpitia" යන ආයතනයෙන් අදාල මුද්‍රණ කටයුතු සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 03 සභාව සතු 252 – 6380 කැබ් රථය සඳහා ටයර් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| කොත්මලේ ටයර් හවුස්,නාවලපිටිය | ස්ටෙනෝර් ටයර් හවුස්,නාවලපිටිය | යුනියන් එන්ටර්ප්‍රයිසස්,නාවලපිටිය | එම්.ජේ.ආර් පීරිස් සහ පුත්‍රයෝ |
|---|---|---|---|
| 184,000.00 | 189,000.00 | 191,000.00 | 179,670.40 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයිම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 04 ජේසීබී යන්ත්‍රය සඳහා ග්‍රීස් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| ආර්.එම් නයන්ත කැලුම්,මල්දෙනිය | කැලුම් කන්ස්ට්‍රක්ෂන්ස්,හැටන් | සීතා ඔටෝ සර්විස්,හැඳුනුවැව |
|---|---|---|
| 30,000.00 | 35000.00 | 34000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "ආර්.එම් නයන්ත කැලුම්,මල්දෙනිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 05 ABC කියුබ් 04ක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| Lohas Metal Crusher Holdings(PVT)LTD,Nawalapitiya | Nandana Metal Crusher,Nawalapitiya | Dana Lakshmi Metal Crusher,Nawalapitiya |
|---|---|---|
| 48000.00 | 58000.00 | 54000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "Lohas Metal Crusher Holdings(PVT)LTD,Nawalapitiya" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 06 සභාව සඳහා ජලනල උපාංග මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | තෙෂාරා හාඩ්වෙයාර්,බලංතොට | මහනුවර ඒජන්සීස්,මහනුවර | කේශව හාඩ්වෙයාර්,බච්චාගම, නාවලපිටිය |
|---|---|---|---|
| 20mm Socket | 65.00 | 62.50 | 70.00 |
| 32mm Socket | 150.00 | 140.40 | 150.00 |
| 40mm Socket | 210.00 | 201.60 | 215.00 |
| 50mm Socket | 300.00 | 290.70 | 310.00 |
| 63mm Socket | 400.00 | 405.00 | 430.00 |
| 90mm Socket | 1270.00 | 1188.00 | 1265.00 |
| 110mm Socket | 1800.00 | 1611.00 | 1720.00 |
| 40mm Valve Socket | 260.00 | 239.40 | 250.00 |
| 32mm Foucet Socket | 160.00 | 140.40 | 150.00 |
| 40mm Foucet Socket | 240.00 | 234.00 | 255.00 |
| 50mm Foucet Socket | 360.00 | 342.00 | 365.00 |
| 32mm Elbow | 160.00 | 150.30 | 160.00 |
| 50mm Elbow | 450.00 | 431.10 | 490.00 |
| 63mm Elbow | 700.00 | 657.00 | 700.00 |
| 90mm Elbow | 1200.00 | 1872.00 | 2000.00 |
| 32mm Bend | 210.00 | 225.00 | 240.00 |
| 50mm Bend | 800.00 | 748.80 | 800.00 |
| 63mm Bend | 1400.00 | 1310.40 | 1400.00 |
| 110mm Bend | 7200.00 | 7303.50 | 7800.00 |
| 20mm T Socket | 75.00 | 80.10 | 85.00 |
| 40mm T Socket | 390.00 | 369.90 | 395.00 |

| | | | |
|---|---|---|---|
| 50mm T Socket | 600.00 | 603.90 | 645.00 |
| 63mm T Socket | 900.00 | 842.40 | 900.00 |
| 32mm*20mm T | 210.00 | 122.40 | 220.00 |
| 90mm * 63mm T | 2600.00 | 1026.00 | 2720.00 |
| 50mm Rubber Socket | - | 290.70 | - |
| 50mm Valve | 900.00 | 1723.50 | 1725.00 |
| 40mm Valve | 800.00 | 1336.50 | 1425.00 |
| 63mm Valve | 800.00 | 2371.00 | 2530.00 |
| 20mm Pipe | 650.00 | 796.50 | 930.00 |
| 32mm Pipe | 2600.00 | 3343.50 | 3740.00 |
| 40mm Pipe | 3700.00 | 4927.50 | 5500.00 |
| 90mm Pipe | 25000.00 | 28215.00 | 30720.00 |
| 110mm Pipe | 31000.00 | 35694.00 | 39060.00 |
| Solvent Cement 500 | 2600.00 | 3442.50 | 3675.00 |
| Blade | 150.00 | 200.00 | 220.00 |
| 20mm Elbow | 60.00 | 65.70 | 70.00 |
| 20mm Valve Socket | 75.00 | 77.40 | 82.00 |
| 20mm Valve | 255.00 | 450.00 | 500.00 |
| 40mm Valve | - | 1336.50 | 1425.00 |
| 50mm Valve | - | 1723.50 | 1840.00 |
| 50mm * 20mm Clamp | - | 1917.10 | 1950.00 |
| 50mm* 20mm T Socket | - | 431.10 | 380.00 |
| 63mm Valve Socket | 180.00 | 441.00 | 470.00 |
| 63mm*20mm Clamp | - | 2198.30 | 2400.00 |
| 63mm Gum Socket | - | 405.00 | 2100.00 |
| 63mm Pipe | 4600.00 | 11308.50 | 12540.00 |
| 63mm Valve | - | 2371.50 | 2530.00 |
| 90mm Rubber Socket | - | 1188.00 | 3000.00 |
| 63mm Rubber | - | 405.00 | 360.00 |
| 50mm Pipe | 3900.00 | 7092.00 | 7900.00 |
| 90mm*20mm Clamp | - | 3043.80 | 2600.00 |
| 50mm Pipe 600 | 20150.00 | 19465.00 | 20270.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත භාණ්ඩ මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 07 ගලබඩ සංචාරක කලාපයේ අලුත්වැඩියා කටයුතු සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| වර්ගය | ජයන්ති ලී<br>වෙලදසැල,නාවලපිටිය | සුජීව ලී<br>මෝල,රඹුක්පිටිය,නාවලපිටිය | තරිඳු ලී<br>මෝල,වැලිගොඩවත්ත,නාවලපිටිය |
|---|---|---|---|
| හවරිනුග (2*2) | 42.50 | 45.00 | 40.00 |
| අඟ (1*8) | 165.00 | 170.00 | 150.00 |
| මාර | 6500.00 (6*2 ½) | ඇල්බීසියා - 7000.00 (6*30) | ඇල්බීසියා - 5500.00 (6*2 ½ ) |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත භාණ්ඩ මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 08 ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | මහවැලි<br>හාඩ්වෙයාර්,බලංතොට | නිව් ලංකා<br>හාඩ්වෙයාර්,රඹුක්පිටිය | කැලණි වැලි බ්ලොක් ගල්<br>වැඩපළ,රඹුක්පිටිය,නාවලපිටිය |
|---|---|---|---|
| Water Tank 500ml | 13700.00 | 13900.00 | 13900.00 |

| | | | |
|---|---|---|---|
| Water Tank 1000ml | 24950.00 | 25300.00 | 25100.00 |
| Tor Steel 01 Bar 10mm | 1225.00 | 1250.00 | 1260.00 |
| Tor Steel 01 Bar 12mm | 1675.00 | 1679.00 | 1685.00 |
| Tor Steel 01 Bar 16mm | 4250.00 | 4400.00 | 4430.00 |
| Nos Bricks Small | 48.00 | 55.00 | 55.00 |
| Feet Amana Sheet 28G | 630.00 | 680.00 | 650.00 |
| Feet Amana Sheet 24G | 795.00 | 890.00 | 820.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "මහවැලි හාඩ්වෙයාර්,බලංතොට" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 09 සභාව සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | ඔමෙක්ස් කම්පියුටර් ටෙක්නොලජීස්,මහනුවර | සුපර්කොම් ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ්,මහනුවර | The Office Shop (Pvt)Ltd,Kandy |
|---|---|---|---|
| කවර් පේපර් | 115.00 | 90.00 | - |
| ව්ජ් බෝඩ් | 950.00 | 875.00 | - |
| ගම් බෝතල් | 1500.00 | 1400.00 | 1575.00 |
| කැල්කියුලේටර් | 6500.00 | 4800.00 | 5300.00 |
| පන්චර් | 8000.00 | 7200.00 | 7320.00 |
| පොප්ලින් | 550.00 | 400.00 | 490.00 |
| ලෙදර්ට් පේපර් | | 675.00 | 715.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "සුපර්කොම් ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ්,මහනුවර" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 10 සභාව සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | ශ්‍රී ලංකා ස්ටෝර්ස්,නාවලපිටිය | Supercom Trading(Pvt)Ltd,Kandy | Suhada Marketing Services,Kandy | The Office Shop (Pvt)Ltd,Kandy |
|---|---|---|---|---|
| ජායා පිටපත් කඩදාසි A4 | 2750.00 | Double A – 3000.00<br>Excellence – 2750.00<br>NK – 2800.00 | 3150.00 | 3250.00 |
| ජායා පිටපත් කඩදාසි A4 (තද පැහැති) | 3750.00 | - | - | - |
| ජායා පිටපත් කඩදාසි A4 (වර්ණ) | 1950.00 | - | - | - |
| ජායා පිටපත් කඩදාසි A3 | 5590.00 | Double A – 6000.00<br>NK – 5500.00 | - | 6200.00 |
| ජායා පිටපත් කඩදාසි B5 | 2350.00 | 2750.00 | 2950.00 | 3000.00 |
| ජායා පිටපත් කඩදාසි Legal | 3650.00 | Double A – 4400.00<br>NK – 3700.00 | 5000.00 | - |
| පිටපත් සහිත පරිඝණක කඩදාසි A4 (දෙපිට) | 14750.00 | - | - | - |

| | | | | |
|---|---|---|---|---|
| පරිඝණක කඩදාසි තනිපිට | 6900.00 | - | - | - |
| සීආර් පොත් පිටු 200 | 625.00 | 398.00 | - | 420.00 |
| සෙලෝටේප් අඟල් 2 | 157.50 | 350.00 | 400.00 | 385.00 |
| සර්වියට් පේපර් පැකට් | 300.00 | - | - | - |
| Computer Sheet | | Golden Form – 6600.00<br>NCF – 6500.00 | - | - |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත භාණ්ඩ මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

සාකච්ජා කිරිමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි පිරිසට ස්තුතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 12.50 පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

1947 න් පසු වැඩිම ගංවතුර ආව අවස්ථාව තමයි මේක.ලංකාවටම ඒකෙන් බලපෑම් උනා.අපිට තමයි ලොකුම හානියක් උනේ.ජීවිත අහිමි උනා.පිට පළාත් වලින් ගොඩක් ආධාර හිමි උනා මේ ප්‍රදේශයට.ගම්පොල පැත්තෙන් කට්ටියක් ඇවිත් ගෙවල් ශුද්ධ කරන්න උදව් කරා.කිතුල්තොට පටුමග හා ලබුවැල්කොටුව ගැන හැමදාම කථා කරනවා විතරයි.ඒ නිසා මේ සැරේවත් අපි මැදිහත් වීමක් වෙමු.ඒ වගේම මාගේ මවගේ දානය දෙන්න සූදානම් කරලා තියෙනවා.ඒ සඳහා සියලු දෙනාට සහභාගී වන මෙන් ආරාධනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>

ගංවතුර වෙලාවේ මගේ ගේ ළඟ බැම්ම කඩාගෙන ගියා.උඩ පාරත් එක්ක කැඩිලා ඇවිත් තියෙන්නේ.ඒක අවධානම්.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>

රඹුක්පිටිය විද්‍යාලයේ පිට්ටනියේ තණකොළ වැවිලා ඒක ඉවත් කරලා දෙන්න කියලා ඉල්ලීමක් තියෙනවා.ඇල්ලවත්ත ටැංකියට යන තැන පඩිපෙළේ මාර ගහක් තියෙනවා ඒකත් ඉවත් කරන්න කටයුතු කරන්න ඕනි.ඒ වගේම ඒකෙ වතුර පිල්ටරේ දාගන්නත් ඕනි.වැස්ස දවසට වතුර බොන්න බෑ.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

අපිට පාවිච්චි කරන්න වැසිකිලියක් නෑ සභාපතිතුමා.ඒ නිසා කාර්යාලයේ වැසිකිලි පද්ධතිය සකස් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.පසුගිය ගංවතුර වේලාවේ ආපදාවට ලක්වූ සමහර පිරිස් වලට ආධාර හම්බ උනා සමහර පිරිස් වලට ආධාර ලැබුනේ නෑ.ඒ සහනයක් ලැබුනේ නැති අයට සහනයක් ලබා දෙන්න පුලුවන් නම් හොදයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මේ සැරේ ආව ගංවතුර තත්ත්වය බරපතල තත්ත්වයක්.වැඩිපුරම හානියට පත් උනේ මුස්ලිම් ජනතාවට.වෙනත් ප්‍රදේශ වලින් ඇවිත් ගොඩක් උදව් කරා.සහනාධාර බෙදා දීමේදී යම් යම් අඩුපාඩු සිද්ධ උනා.ආධාර දෙන අයව ප්‍රාදේශීය ලේකම්තුමා කැදවලා කිව්වා ආධාර ලබා දීම ගැන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කරන්න කියලා.අවතැන් උන සියලු දරුවන්ට ගිය සතියේ අවශ්‍ය පාසල් උපකරණ ලබා දුන්නා.ප්‍රාදේශීය ලේකම්තුමා,ග්‍රාම නිලධාරිතුමා ඇතුළු සියලු නිලධාරින් විශාල කැපකිරිමක් කරා මේ අවස්ථාවේ.ආපදාවට ලක් වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත් කරන්න රජයෙන් වැඩපිළිවෙලක් දියත් කරනවා.

ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය
මාපාකන්ද ජල යෝජනා ක්‍රමය සදහා ජීඅයි බට ලබා දෙනවා කියලා ඇමතිතුමා කියලා තියෙනවා.ඒ ගැන බලන්න කියලා කිව්වා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ජල සම්පාදනයෙන් තමයි ඔය බට ටික අරන් දෙන්න ලැස්ති උනේ.හැබැයි දැන් බට නෑ එහෙත්.ලැබුණු ගමන් දෙන්නම් කියලා තිබුණා.

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
වැවේගම ප්‍රජා ජල යෝජනා ක්‍රමය එයාලා හරියට නඩත්තු කරන්නේ නෑ.ඒ නිසා ඒක සභාවට පවරා ගන්න කටයුතු කරන්න පුලුවන් නම් හොදයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
එයාලට මං කථා කරා.එයාලත් කැමති උනා.උත්තරයක් එවන්නම් කියලා කිව්වට තවම ලැබුනේ නෑ.

ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා
ප්‍රජා ජල එකේම සමහර අය අතර ගැටුම් තියෙනවා.සමහර අය සල්ලි ගෙවන්නෙත් නෑ.සභාවට පවරා ගෙන නඩත්තු කටයුතු කරන්න පුලුවන් නම් හොදයි.